# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**මුදල් අමාත්‍යාංශය**

**සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**நிதி அமைச்சு**

**சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு**

Ministry of Finance

**State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development**


| මගේ අංකය / எனது இல / My No | DSD/HO/04/ER/09- 2020- ගෘහ ආර්ථික | ඔබේ අංකය / உமது இல / Your No | ........................ | දිනය / திகதி / Date | 2020.10.06 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරී.

**<u>ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ</u>**
**<u>ජාතික ගෙවතු වගා වැඩසටහන - 2020/21 මහ කන්නය</u>**

උක්ත වැඩසටහන සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ප්‍රධාන අමාත්‍යාංශ 06 ක ලේකම්වරුන්ගේ අත්සනින් යුතුව නිකුත් කර ඇති ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබලගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන 2020/21මහ කන්නය මැයෙන් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක SMS/HRD/HEU/01 හා 2020.09.18 දිනැති ලිපිය සමඟ නිකුත් කළ උපදෙස් පත්‍රිකා අංක 01 මේ වන විටත් විද්‍යුත් තැපැල ඔස්සේ ඔබ වෙත ලබාදීමට කටයුතු කර ඇත.

02. බීජ තවාන්, ගෙවතු සඳහා බීජ පැකට් ලබාදීමේ මූලික කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර කලින් සැලසුම් කළ පරිදි බීජ තවාන් කිරීම ප්ලාස්ටික් ට්‍රේ / කඩදාසි පල්ප් වලින් නිමකල බිත්තර රඳවන තැටි යොදා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවයක් මතුව ඇත. එබැවින් මේ සඳහා කෘෂිකර්ම උපදේශකගේ නිර්දේශය මත ප්‍රශස්ථ ඝනකමින් හා ප්‍රමාණයෙන් යුතු පොලිතීන් භාවිතා කිරීම සුදුසු වේ.පොලිතීන් මිලදී ගැනීමට පැල තවාන්කරුවන්ට මුදල් අවශ්‍ය වේ නම් එය සපයා ගැනීමට ජීවනෝපාය චක්‍රීය අරමුදල හෝ 4% පොළී අනුපාතය යටතේ සමෘද්ධි බැංකු ණයක් ලෙස හෝ ලබා ගත හැකිවේ.

03. ග්‍රාම නිලධාරී වසම සඳහා පැල ලබාදීමේදී පැල අවශ්‍යතාවය සම්බන්ධයෙන් ග්‍රාමීය කමිටුව තීරණයකට පැමිණ තෝරාගත් ගෘහ ඒකක සඳහා අසාධාරණයක් නොවන පරිදි පැල ලබාදීම වැදගත් වේ. මෙහිදී සියළු ගෘහ ඒකක ආවරණය වන අයුරින් ගෘහ ඒකකයක් සඳහා පැල 12 ක් ලෙස ලබාදීම සුදුසු වන අතර පොලිතීන් සඳහා වැය වූ මුදල ද එකතු කර එක් පැලයක් සඳහා රු. 4.50 බැගින් තවාන්හිමියන්ට ගෙවීමට 2020 සැප්තැම්බර් 10 දින රැස්වූ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මඟින් තීරණය කර ඇත.


D/j... 1වන අදියර, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

04. ග්‍රාම නිලධාරී වසම් සඳහා බීජ පැකට් ලබාදීමට අදාල ඇසුරුම් කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. ඉහළ ගුණාත්මයෙන් යුත්ත බීජ විශාල ප්‍රමාණයක් සපයාගැනීමේ අපහසුතාවය මත ගෘහ ඒකක ලක්ෂ 5 ක් සඳහා ප්‍රමාණවත් බීජ ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකඟ වී ඇත. මෙම සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් ග්‍රාම නිලධාරී සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී යන දෙදෙනාගේම එකඟතාවය මත බීජ පැකට් බෙදාහැරීම සුදුසු වේ. වසම සඳහා අවශ්‍ය වන හිඟ බීජ ප්‍රමාණය රජයේ ගොවිපල / කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල/ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද ගොවිපල හෝ දැනට ඔබ විසින් හඳුනාගත් පැල තවාන් හිමියන් හෝ ප්‍රදේශයේ සිටින ගොවීන්ගෙන් ගෙවතු හිමියන්ට අවශ්‍ය ඉතිරි බීජ ප්‍රමාණය ලබාදීමට කටයුතු කළ හැකිය. බීජ මිලදී ගැනීමේදී ගුණාත්මය පිළිබඳව සෑහීමකට පත්විය යුතු වේ .එම බීජ සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඔබ දිස්ත්‍රික්කයට ලබාදීමට නියමිත බීජ පැකට් ප්‍රමාණය **ඇමුණුම 1** හි සඳහන් කර ඇත.

05. මෙම ගෘහ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන ඉදිරියේදී අදියර කීපයකින් ක්‍රියාත්මක වීමට නියමිතය.එබැවින් ගෘහ ඒකක සඳහා ප්‍රතිලාභ ලබාදීමේදී තෝරාගත් සුදුසු ගෘහ ඒකක සඳහා අදාල යෙදවුම් බෙදීයන අයුරින් ලබාදීම වැදගත් වේ.

06. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් තෝරාගත් ගෘහ ඒකක සඳහා අනෙකුත් රේඛීය ආයතන මඟින් පහත සඳහන් ප්‍රතිලාභ ලබාගත හැකි බැවින් මේ සමඟ අමුණා ඇති ආකෘති මඟින් ඒ ඒ ව්‍යාපෘති සඳහා වූ සාරාංශ වාර්තාවන් jeevonopaya@gmail.com විද්‍යුත් ලිපිනය ඔස්සේ ලබාදෙන මෙන් දන්වන අතර එම තොරතුරු පහත ආයතන වල විද්‍යුත් තැපැල් ලිපිනයන් ඔස්සේද ලබාදීම අවශ්‍ය වනු ඇත. මේ හැරුණු විට මෙම ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂිත ගෙවතු හිමියන් පිළිබඳ තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී ලබා ගැනීමට හැකි වන පරිදි දිස්ත්‍රික් කාර්යාලයේ තබාගත යුතු වේ. ගෘහ ඒකකය සතු සම්පත් විභවතාවය හඳුනාගෙන ඒ ඒ ගෘහ ඒකකයේ හැකියාව, රුචිකත්වය මත මෙම ව්‍යාපෘති සඳහා සුදුසු ගෙවතු හිමියන් තෝරා ගැනීම ඵලදායි වන බැවින් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

07. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගෘහ ඒකක වෙත පැල, බීජ පැකට් හා අනෙකුත් යෙදවුම් ද්‍රව්‍ය ලබාදීමේදී ඒවා භාරගත් බවට අත්සන යෙදූ ලේඛණ ලබාගෙන අදාල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමණාකරු භාරයේ තබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

- **අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - dea.gov.lk - ඇමුණුම ii**

  කුඩා ගෙවතු සඳහා පහත දක්වා ඇති අයුරින් පැල ලබාදීමේ හැකියාවක් පවතින අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැල තවාන් වල පවතින පැල ඉදිරියේදී අදියර වශයෙන් ලබාදීමේ හැකියාවක් පවතී.

  ගම්මිරිස් පැල 1-5
  කුරුඳු පැල 2-5
  සාදික්කා පැල 1
  කරාබු පැල 1

- **ආයුර්වේද දෙපාර්තමේන්තුව - sudeepabmari@yahoo.com - ඇමුණුම iii**

  ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් 2020 මහ කන්නයේදී දිස්ත්‍රික්ක 10 ක ග්‍රාම නිලධාරී වසම් 1,000 ක ගෘහ ඒකක 100 බැගින් වන පරිදි නිවාස 10 යේ පොකුරු නිවාස ලෙස එකිනෙකට වෙනස් වර්ගයේ ඖෂධ පැල 02 බැගින් ලබාදීමට නියමිතයි.ඒ අනුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී සමඟ එක්ව හඳුනාගත් ගෘහ ඒකක පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් සාරාංශ වාර්තාවක් සමඟ සමෘද්ධි දෙපාර්තමේන්තුව හා ඉහත සඳහන් ඊමේල් ලිපිනය වෙත යොමු කළ යුතු වේ.

- **පොල් වගා කිරීමේ මණ්ඩලය - krishkandy@gmail.com - ඇමුණුම vi**
  වියළි කලාපයට අයත් දිස්ත්‍රික්කයන් සඳහා පමණක් මහ කන්නයේදී පොල් පැල 140,000 ලබාදීමට නියමිතය.

| දිස්ත්‍රික්කය | ලබාදීමට නියමිත පොල් පැල ප්‍රමාණය | දිස්ත්‍රික්කය | ලබාදීමට නියමිත පොල් පැල ප්‍රමාණය |
|---|---|---|---|
| හම්බන්තොට | 18194 | මඩකලපුව | 10900 |
| පුත්තලම | 17310 | වව්නියාව | 3254 |
| මොණරාගල | 10075 | යාපනය | 13740 |
| අනුරාධපුරය | 21922 | මන්නාරම | 4830 |
| පොලොන්නරුව | 9320 | මුලතිව් | 4300 |
| අම්පාර | 15887 | කිලිනොච්චිය | 3000 |
| ත්‍රිකුණාමලය | 7270 | | |
| **උප එකතුව** | **99976** | **උප එකතුව** | **40024** |
| **මුළු එකතුව** | | | **140000** |

- **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - livestockstats@yahoo.com - ඇමුණුම v**
  ගෙවතු හිමියන්ගේ ඉල්ලීම මත එක් ගෙවත්තක් සඳහා ගෘහස්ථ කිකිළි පැටවුන් 10 ක් ලබාදීම. මෙහිදී යාබද ගෘහයන් අතර හුවමාරු කරගත හැකිවන පරිදි ගෙවල් 05 කට එක් ගෘහස්ථ කුකුළු පාලන ඒකකයක් වන ලෙස ගෙවතු හිමියන් තෝරා ගැනීම සුදුසුවේ. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ කිකිළි පැටවුන් ලබාදීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් හඳුනාගත් ගෘහ ඒකක පිළිබඳ තොරතුරු ලබාදිය යුතු වේ.

- **ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය - directorext@naqda.gov.lk -ඇමුණුම vi**
  පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැක.

  පහත සඳහන් ධීවර ව්‍යාපෘති යටතේ හඳුනාගනු ලබන ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. මෙම එක් එක් ධීවර ව්‍යාපෘති පිළිබඳ විස්තර පත්‍රිකා මීට අමුණා ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | මඩ පොකුණු තුළ මසුන් වගාව - එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් එක් අයෙකු බැගින් හඳුනාගැනීම වැදගත් වේ. | 6. | දැල් කූඩු තුළ මසුන් වගා ගොවිපල ඇති කිරීම |
| 2. | කුඩා පරිමාණ විසිතුරු මත්ස්‍ය වගාව | 7. | කුඩා පරිමාණ මත්ස්‍ය ආහාර නිෂ්පාදන ඒකක පිහිටුවීම |
| 3. | කාලීන ජලාශ වල මසුන් වගාව - ව්‍යාපෘති 500 ක් සඳහා | 8. | මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩි දියුණු කිරීම |
| 4. | වතු පොකුණු / වතු ජලාශ වල ජලජීවී වගාව - වතු ආශ්‍රිත ජනාශ හඳුනාගෙන මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු දන්වා එවිය යුතු වේ. | 9. | මුහුදු පැලැටි වගාව - උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක සඳහා පමණි |
| 5. | විසිතුරු මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම - කොළඹ, ගම්පහ, කළුකර දිස්ත්‍රික්ක වල ව්‍යාපෘති 150 ක් සඳහා අවස්ථාව ඇත | 10. | කූඩු තුල මෝදා මසුන් වගාව - උතුරු හා නැගෙනහිර පළාත් සඳහා විශේෂිත වේ. |

08. ඔබ දිස්ත්‍රික්කයේ පලතුරු පැල අවශ්‍යතාවය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබා ගත යුතු අතර එහි දිස්ත්‍රික්ක සාරාංශ වාර්තාවක් ද සකස් කළ යුතු අතර එම තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබාදීම පිණිස දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ තබාගත යුතු වේ. එමෙන්ම දිස්ත්‍රික් සාරාංශ වාර්තාව ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුය. - **ඇමුණුම vii**

09. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගෘහ ඒකක වෙත පැල තවාන් මගින් පැල හා එළවළු බීජ පැකට් පමණක් සෘජුව ලබාදෙන අතර අනෙකුත් අංශ වලට අදාල යෙදවුම් ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ලබාදීමට නියමිත අතර අදාල යෙදවුම් සඳහා වන වියදම් එකී ආයතන විසින් දරණු ඇත.

10. ඔබ දිස්ත්‍රික්කයේ ගෙවතු වැඩසටහන ක්‍රියාත්මක කළ නොහැකි වසම් පිළිබඳ තොරතුරු **ඇමුණුම viii** මගින් ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. රාජ්‍ය ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි.
8. අධ්‍යක්ෂ ජනරාල්,සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
9. සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය - කා.දැ.ගැ.පි.
10. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.